# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සමාගම් (සංශෝධන)

**2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ**
**පනත් කෙටුම්පතකි**

---

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන්
නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන
අමාත්‍යතුමා විසින් 2019 ඔක්තෝබර් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2019 ජූලි මස 23 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[300 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මඟින්, (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2007 අංක 07 දරන සමාගම් පනතේ 427 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ චංචල දේපළ පිළිබඳ සුරක්ෂිතලත් ගනුදෙනුවලට අදාළ විධිවිධාන සැලැස්වීම සඳහා 2019 අංක    දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත සම්මත කිරීමට ආනුෂංගිකව සමාගමක් විසින් ප්‍රදානය කරනු ලබන චල සෘණ භාර එම සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ විධිවිධානවලට යටත් කිරීම වේ.

***3 වන වගන්තිය*** : මෙම වගන්තිය මඟින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 428 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් චංචල දේපළක් පිළිබඳව වූ චල සෘණ භාරයක් ඇති කරන යම් සාධන පත්‍රයක් 2019 අංක    දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය*** : මෙම වගන්තිය මඟින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 431 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් චංචල දේපළක් පිළිබඳව ඇති කරන ලද චල සෘණ භාරවල ප්‍රමුඛතාව තීරණය කිරීමේ දී 2019 අංක    දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ විධිවිධාන අදාළ කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***5 වන වගන්තිය*** : මෙම වගන්තිය මඟින්, ප්‍රධාන ප්‍රඥප්තියට 433අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එමගින් 2019 අංක    දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත අදාළ කර ගැනීමේ කාර්යය සඳහා "චල සෘණ භාරය" යන යෙදුමට අර්ථ නිරූපණයක් ඇතුළත් කරනු ලැබේ.

එල්.ඩී.—ඕ. 68/2017

**2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මේ පනත 2019 අංක    දරන සමාගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

2007 අංක 07 දරන පනතේ 427 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2007 අංක 07 දරන සමාගම් පනතේ 427 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ "(117 වන අධිකාරය වන) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ විධිවිධානවලට " යන වචන සහ ඉලක්කම් වෙනුවට "2019 අංක    දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ විධිවිධානවලට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 428 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 428 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ, "එය විකුණුම් පත්‍රයක් වූ ලෙස සලකා" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් ඇති සියලු වචන සහ ඉලක්කම් වෙනුවට "එය විකුණුම් පත්‍රයක් වූ ලෙස සලකා 2019 අංක   දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කළ යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ චල සෘණ භාරය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 431 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 431 වන වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(7) යම් සමාගමකට අයත් යම් චංචල දේපළක් 2019 අංක    දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කර ඇති චල සෘණ භාරයකට යටත් වන අවස්ථාවක, ඒ පනතේ ඇතුළත් ප්‍රමුඛතාවට අදාළ විධිවිධාන ඒ චල සෘණ භාරයේ ප්‍රමුඛතාව නිශ්චය කිරීමේ දී අදාළ විය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 433අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 433 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 433අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"අර්ථ නිරූපණය.

433අ. මේ පනතේ මේ කොටසෙහි "චල සෘණ භාරය" යන්නෙන්, 2019 අංක    දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්යය සඳහා "සුරකුු අයිතිවාසිකමක්" අදහස් වේ.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.